


# සමාජයට "පෙණ ගොබය" ඉල්ලා සිටිමි

විදර්ශන මහත් අභිරුචියකින් කියවන පාඨකයින් කිහිපදෙනෙකු පසුගියදා මට මුණගැසිණි. ඒ පුෂ්පා තිසේරා නම් වූ ගායන ශිල්පිනියගේ "ඒ වසන්තයමයි" ගීත එකතුව එළිදුටු සොඳුරු සැඳෑවේදීය. ඔවුන් මට එයට පෙර කිසි දිනක හමුවී නොතිබුණි. එබැවින් විදර්ශන පිළිබඳ ඔවුන් පවසන දෑ හිතවතෙකුගේ අදහස් වලට වඩා වැදගත් කොට සැළකිය යුතු යයි මම සිතමි. මන්ද එහි වැඩි හිතවත්කමට කරනු ලබන " අතිශයෝක්තියක්" හෝ හිතවත්කමට මුවාවී කරනු ලබන "කුහක විවරණයක්" ගැබ්වීමේ හැකියාව අවම බැවිනි.

වරක් මා සුනිල් එදිරිසිංහයන්ගේ නවතම නිර්මාණයක් වූ "දුවේ නුඹ මගෙ ප්‍රාණයයි" ගීතය පිළිබඳ විදර්ශන තුළින් විවරණයක් ඉදිරිපත් කළෙමි. එම විවරණය කියවා ඊට පාදක වූ ගීතය සොයාගෙන ශ්‍රවණය කළ පාඨකයකු ද මට එදින හමුවූවන් අතර සිටියේය.

තවත් එවැනි ගී තෝරාගෙන විවරණය කරන්නැයි ඔහු මට සුහදශීලීව ඇරයුම් කළේය. එහෙත් විදර්ශන එවැන්නකට කොටු කිරීමට මා අකමැති බවත් ඉඳහිට එවැනි සුවිශේෂ ගීත විවරණයකින් විදර්ශන සරසන්නටත් මට එකඟතාව පළකළෙමි. කෙසේ නමුත් ගීත විවරණය යනු ගීතයේ මතුපිට අදහස පිටුපුරා විස්තර කිරීම නොවන වග ඔහු හඳුනාගෙන තිබීම පිළිබඳ මා නිහතමානීව සතුටට පත්වෙමි. ඔහු වැනි නිහඬ එහෙත් අවධියෙන් සිටින පාඨකයින් තවත් මෙල්බර්න් නුවර සිටින බව මගේ විශ්වාසයයි. එම පාඨක රුචියට හිස නමමින් මෙවරද තවත් සුරස ගීතයක් විවරණයට මම ඉඩ හසර සකසා ගනිමි.

නා කොළ අන්දම් පෙණ නොවටින්නේ
බෝ කොළ අන්දම් පෙණය දියන්නේ
පෙනේ නැතිව අපි කොහොමද ඉන්නේ
සමාවෙයන් නයි හාමී

දරමිටි බඳිනා කඹය කියාවී
දරුණුව හදලා වළඳා තියාවී
කැබලිති අරගෙන ගැරඬි නටාවී
පෙනේ නැතිව අපි අසරණ වේවී
පෙනේ දියන් නයි හාමී

ඉහින් කනින් විස වැගිරෙන ලෝකේ
විසෙන් උඹේ පල නැතිවග තේරේ
සුරම්‍ය වූ මේ සර්ප විමානේ
හොඳින් ඉන්න අපටත් සන්තෝ සේ
පෙනේ දියන් නයි හාමී

ගී පද - රත්න ශ්‍රී විජේසිංහ
ගායනය හා සංගීතය - විශාරද ගුණදාස කපුගේ

("ඉරබටු තරුව" සංයුක්ත තැටිය 1999)

අනෙක් සර්පයින් අතර නාගයා හඳුනාගැනීම පහසුය. ඒ උඟු සතු සුවිශේෂ පෙනගොබය නිසාවෙනි. සැබැවින්ම පෙනය නාගයාගෙ හුදු බාහිර පිහිටීමක් නමුදු එය නාගයාට ප්‍රබල ආකර්ශනයක් හා අන්‍යන් තැති ගැන්විය හැකි අපූරු බලයක් ආරෝපනය කරයි. සතුරාට එරෙහිව


ගුණදාස කපුගේ

පහරදීමට පෙර සතුරා තැති ගන්වා පලවා හැරීමට මෙම පෙණය සතු ගම්භීර හැඩරුව බෙහෙවින් ඉවහල් වේ. එබැවින් පෙණය නාගයා සතු විෂට, අමතර බරක්, බලයක් ආරූඪ කරයි.

අප සාකච්ඡාවට ලක් කරන ගීතයේ එවන් වූ පෙණයක් අපේක්ෂාවෙන් නාගයෙකු ආමන්ත්‍රණය කරන මානවකයකුගේ හඬ මූලික අද්දැකීම ලෙස අපට ශ්‍රවනය කළ හැකිය. ඔහු අපේක්ෂා කරන්නේ නා කොළ වැනි පෙණයක් නොවේ. බොහෝ සර්පයින් සතුව ඇත්තේ නා කොළ සදිසි කුඩා පෙනගොබයකි. එහෙත් ඉන් සතුරා එකවර සසල නොකරයි. අන්‍යන් මත එකවර තර්ජනය මුදාහල හැකි ගම්භීර බවක් එහි නැත. එබැවින් මේ මානවකයා එවන් පෙනයක් අපේක්ෂා නොකරයි. ඔහුගේ ඉල්ලීම බෝ කොළයක් සදිසි පෙණයකි. බෝ කොළයක් සදිසි පෙණයක් ඇත්තේ නාගයෙකු සතුව පමණි.

පෙන ගොබය නාගයාට සතුරා බිය ගැන්විය හැකි බාහිර පෙනුමක් ආරෝපනය කරන ඉන්ද්‍රියක් මිස ඉන් කළ හැකි අන් යමක් නොමැත. එහෙත් මේ මානවකයා ඉල්ලා සිටින්නේ නාගයාගේ විෂ නොව තර්ජනය කොට අනෙකා භීෂණයට පත්කර හැකි බාහිර බලයක් ආරෝපනය වූ පෙණයයි.

මේ පෙණය යන සංකේතයේ සැබෑ අරුත කුමක්ද ? එනම් සිවිල් සමාජයේ අධිකාරී බලයයි. නැතහොත් අන්‍යයන් මත තම සිවිල් බලය පතුරා ඒ මතින් තම අරමුණු කරා ළඟා විය හැකි පරපීඩක ශක්තියයි. තවකෙකු බියකොට සමාජයේ ඉහළින් වැජඹෙන්නට මෙම "පෙණය" අවශ්‍ය වේ. මෙවන් පෙණයක් අහිමි සමාජ පන්තියේ ඉරණම කෙබඳු වේද ? බලනු මැනවි.

" දරමිටි බඳිනා කඹය කියාවී
දරුණුව හදලා වළඳා තියාවී
කැබලිති අරගෙන ගැරඬි නටාවී
පෙනේ නැතිව අපි අසරණ වේවී
පෙනේ දියන් නයි හාමී"

පෙනය අහිමි සමාජ ස්ථරය තුළ ගැරඬින් පවා ආරෝපණය කරගත් සිවිල් බලයකින් හැසිරෙන


රත්න ශ්‍රී විජේසිංහ

අයුරු කවියාගේ නිරීක්ෂයට හසුවේ.

නාගයා සතු විෂ දළ වූ කලී දඩයම් කොට ජීවිතය රැකගැනීම සඳහා නිර්මාණය වූ අංගයක් මිස එය උරගයින් අතර රජ වීමට ලද ආභරණයක් නොවේ. එහෙත් ලොව ඉහළම බුද්ධියට හිමිකම් කියන මිනිසාට එවැනි විෂ සහිත ඉන්ද්‍රියක් පිහිටා නොමැත. මන්ද ඔහුගේ බුද්ධිය විසින් තම පැවැත්ම නිර්මාණය කරන බැවිනි. එහෙත් මිනිස් සමාජය තුළද හලා හල විෂ ඇති බවට කවියා කරන ප්‍රකාශයෙහි අරුත කීම.

"ඉහින් කනින් විෂ වැගිරෙන ලෝකේ
විසෙන් උඹේ පල නැති බව තේරේ
සුරම්‍ය වූ මේ සර්ප විමානේ
හොඳින් ඉන්න අපටත් සන්තෝසේ
පෙනේ දියන් නයි හාමී"

"ඉහින් කනින් විෂ වැගිරෙන" මානව සමාජයට විෂ යනු පලක් ඇති දෙයක් නොවන බවට කවියා කරණු ලබන ප්‍රකාශය ප්‍රබල උත්ප්‍රාසයක් මතු කරන්නකි මානව සමාජය "සුරම්‍ය වූ සර්ප විමානයක්" ලෙස මතු කරන සංකේතාර්ථ යද එවැනිම ප්‍රබල උත්ප්‍රාසාත්මක යෙදුමක් ලෙස ගීතයේ අර්ථය විශද කරයි. එබැවින් මෙම සර්ප විමනයේ යහතින් සිටින්නට නම් සර්පයන් අතර ආධිපත්‍ය පැතිරවිය හැකි සුවිශේෂත්වයක් අවශ්‍ය වේ. පෙනය සුවිශේෂ වන්නේ එම අරුතිනි. නා කොළ සදිසි පෙණයක අවශ්‍යතාව එයයි.

ධනේෂ්වර සමාජ වටිනාකම් විසින් අතුර කරන ලද මනුෂ්‍ය අධ්‍යාත්මයේ අසරණභාවයත් අනාරක්ෂිත භාවයත් ගීතය තුළින් සාකච්ඡා කෙරෙන අතර සිවිල් සමාජ වටිනාකම් පොදි බැඳගත් පාරිභෝගික සමාජය වෙත ඔහු හෙලන ගැඹුරු උපහාසයත් ගීතය තුළ කැපී පෙනේ.

ජන නාද රටා බහුල ලෙස උපයෝගී කරගනිමින් ගීතයට කපුගේ විසින් නිර්මිත සංගීතය එහි අන්තර්ගතය ප්‍රබල ලෙස ඔසවා තබන අතර ගීතයෙහි මූලික අද්දැකීම විසින් අපේක්ෂිත ප්‍රාණයත් මාධූර්යයත් ඊට ප්‍රදානය කිරීමට කපුගේ සතු ගැඹුරු කටහඬ සමත් වී තිබේ.

රවී සිරිවර්ධන
ravi.siriwardhín@gmail.com

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

Professional, Quality Service Assured

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila




